කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය , එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය/ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ). 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ). 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

	අදාල ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	ප්‍රමිතියේ 3 වන පරිච්ඡේදයේ 3.20 ඡේදයට පටහැනිව වසරක කාලයකදී ආපසු ගෙවිය යුතු දිගුකාලීන ණය ප්‍රමාණය ජංගම වගකීම් යටතේ හෙළිදරව්කර නොතිබුණි.	නිවැරදිව හෙළිදරව් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව.	ප්‍රමිතිය ප්‍රකාරව නිවැරදි හෙළිදරව් කිරීම් කළ යුතුය.
(ආ)	ප්‍රමිතියේ 3 වන පරිච්ඡේදයේ 3.29 ඡේදය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් වන මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී සමාලෝචිත වර්ෂයේ රු. 15,915,344 ක් වූ සේවක ණය ගෙවීම, රු. 12,813,648 ක් වූ සේවක ණය එකතුකර ගැනීම, රු. 27,641,931 ක් වූ ලද පොලී වටිනාකම හා ගෙවා තිබුණු රු. 1,480,770 ක් වූ පොළිය මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගලපා නොතිබුණු අතර වර්ෂය තුලදී දේපළ පිරියත උපකරණ විකිණීමෙන් ලද රු. 9,937,000 ක් හා දේපළ පිරියත උපකරණ මිලදී ගැනීම් රු. 75,008,814 ක් දක්වනු වෙනුවට මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල රු. 138,601,408 ක් ලැබීමක් ලෙස ගලපා තිබුණි. තවද වර්ෂය තුලදී ස්ථාවර තැන්පතු ආයෝජන රු. 50,000,000 ක් වෙනුවට මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල රු. 70,965,606 ක් ලැබීමක් ලෙස ගලපා තිබුණි.	නිවැරදිව මුදල් ප්‍රවාහය සැකසීමට කටයුතු සිදුකරන බව.	ප්‍රමිතිය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය.

(ඈ)	ප්‍රමිතියේ 3 වන පරිච්ඡේදයේ 3.30 ඡේදයට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍යකරණ ක්‍රියාකාරකම්වලින් වන මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී සමාලෝචිත වර්ෂයේදී ලැබුණු ප්‍රාග්ධන වියදම් ප්‍රදාන රු. 34,498,559 ක් වෙනුවට රු. 83,855,995 ක් ලෙස ගලපා තිබුණු අතර දිගුකාලීන ණය ආපසු ගෙවීම රු. 4,694,400 ක් ගලපා නොතිබුණි.	නිවැරදිව මුදල් ප්‍රවාහය සැකසීමට කටයුතු සිදුකරන බව.	ප්‍රමිතිය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය.
(ඈ)	ප්‍රමිතියේ 3 වන පරිච්ඡේදයේ 3.32 ඡේදය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වන මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී සමාලෝචිත වර්ෂයේදී පොලී ආදායම රු. 34,264,601 ක් වෙනුවට රු. 209,272,419 ක් ගලපා තිබුණු අතර හුවමාරු නොවන ගනුදෙණුවලින් ලැබිය යුතු දෑ අඩු වීම රු. 117,076,278 ක් වෙනුවට රු. 267,931,399 ක් ගලපා තිබුණි.	නිවැරදිව මුදල් ප්‍රවාහය සැකසීමට කටයුතු සිදුකරන බව.	ප්‍රමිතිය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය.
(ඉ)	ප්‍රමිතියේ 9.5 ඡේදය ප්‍රකාරව හීන වන ශේෂ ක්‍රමයට ක්ෂය (වියදම) හඳුනාගෙන තිබූ නමුත් ක්‍රමක්ෂය (ආදායම) හඳුනාගෙන තිබුණේ සරල මාර්ග ක්‍රමයටය.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලදී නිවැරදි කිරීමට කටයුතු සිදුකරන බව.	ප්‍රමිතිය ප්‍රකාරව නිවැරදිව මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කළ යුතුය.

1.6.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මංමාවත්, පාලම් හා බෝක්කුවලට අදාළ ක්ෂය ප්‍රතිපත්තිය අනෙකුත් දේපළ පිරියත හා උපකරණවල ක්ෂය ප්‍රතිපත්තියට පටහැනි විය. තවද මංමාවත්, පාලම් හා බෝක්කුවලට අදාළව අනුගමනය කරන ක්ෂය ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.	ප්‍රත්‍යාගණනයේදී හඳුනාගත් වටිනාකම ක්ෂය නොකරන අතර, ඒ බව මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර තිබුණු බව.	අනුගමනය කරන ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය.
(ආ)	ඉකුත් වර්ෂය දක්වා උපචිත පදනමට ගිණුම්ගත කළ මුද්දර ගාස්තු හා උසාවි දඩ, සමාලෝචිත වර්ෂයේ මුදල් පදනමට ගිණුම් තැබීම නිසා ගිණුම් ප්‍රතිපත්ති 02 ක් පදනම්	වර්ෂයේදී ලැබෙන මුදල් පමණක් වර්ෂයේ ආදායම ලෙස හඳුනාගැනීම.	ගිණුම් ප්‍රතිපත්ති වෙනස් කරන්නේනම් ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කළ යුතු අතර මූල්‍ය

	කරගෙන තිබුණි.		ප්‍රකාශවල දැක්වෙන වටිනාකම විගණනයට තහවුරු කළ යුතුය.

1.6.3 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දේපළ පිරියත හා උපකරණ සඳහා වූ ක්ෂය රු. 22,936,235 ක් වුවද, එය රු. 23,151,875 ක් ලෙස දක්වා තිබුණු හෙයින් රු. 215,640 කින් අතිරික්තය අඩුවෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු සිදුකරන බව.	නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හුවමාරු ගණුදෙනුවලින් වන අයභාරය යටතේ ව්‍යාපෘති ආදායම වූ රු. 251,896 ක් පොලී ආදායම යටතේ දක්වා තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු සිදුකරන බව.	ගිණුම් නිවැරදිව වර්ගීකරණය කළ යුතුය.
(ඇ)	විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වෙනත් විස්තීර්ණ ආදායම යටතේ ප්‍රාග්ධන වියදම් ප්‍රදානවලින් අතිරික්තයේ හෝ ඌනතාවයේ හඳුනාගත් ප්‍රාග්ධන වියදම් අඩුකර වසර සඳහා විස්තීර්ණ ආදායම ලෙස රු. 71,264,235 ක් දැක්වියයුතු වූවත් රු. 167,842,105 ක් දක්වා තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු සිදුකරන බව.	නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළ යුතුය.
(ඈ)	දුරකථන සම්බන්ධතා සැකසීම හා ජාලගත කිරීම වෙනුවෙන් දරන ලද රු. 882,000 ක වියදම ප්‍රාග්ධනිත කරනු වෙනුවට වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු සිදුකරන බව.	ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.
(ඉ)	2023 වර්ෂයේදී අමාත්‍යාංශයක් විසින් පවරා දී තිබුණු රු. 2,800,000 ක් වටිනා ජීප් රථය 2024 වර්ෂයේ ප්‍රදානයක් ලෙස සටහන්කර තිබුණි. එම ජීප් රථය සඳහා 2024 වර්ෂයේ ක්ෂය කර නොතිබූ අතර ආදායමට රු. 112,000 ක් හඳුනා ගෙන තිබුණි. 2024 වර්ෂයේ දරන ලද රු. 1,398,950 ක වියදම ප්‍රාග්ධනිත කර තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු සිදුකරන බව.	නිවැරදිව ගිණුම්ගත කිරීම් සිදු කළ යුතුය.

(ඊ)	සල්මල් උයන පෙර පාසැල් නව ගොඩනැගිල්ලට අදාළව රු. 429,346 ක වැඩ පමණක් නිමකර තිබියදී 2024 වර්ෂයේ අවසානයට කෙරීගෙන යන වැඩ ගිණුමෙන් රු. 3,870,109 ක් ගොඩනැගිලි ගිණුමට මාරුකර තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු සිදුකරන බව.	නිවැරදිව ගිණුම්ගත කිරීම් සිදු කළ යුතුය.
(උ)	අතරමඟ නතර කර දමා තිබුණු ආදාහනාගාරයක කළ වැඩ වටිනාකම රු. 596,002 ක් වෙනුවට රු. 8,142,531 ක් කෙරීගෙන යන වැඩ ගිණුමට හර කිරීම නිසා කෙරීගෙන යන වැඩ ගිණුමේ හා ණයහිමි ගිණුමේ ශේෂය රු. 7,546,528 ක් වැඩියෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු සිදුකරන බව.	නිවැරදිව ගිණුම්ගත කිරීම් සිදු කළ යුතුය.
(ඌ)	2024 වර්ෂය තුළ මිලදීගත් එකතුව රු. 718,605 ක ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් ප්‍රාග්ධනිත කර නිවැරදි කිරීමට කටයුතු සිදුකරන බව.	වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

1.6.4 අධිකාරි බලය නොලත් ගණුදෙනු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2020 වර්ෂයේ සිට පැවත එන පරිසර බලපත්‍ර හිඟ ශේෂයෙන් රු. 49,750 ක මුදලක් කිසිඳු අනුමැතියකින් තොරව කපාහැර තිබුණි.	2024 ජුනි 18 දින පැවති පරිපාලන හා කළමනාකරණ කමිටු අනුමැතිය ලබා ගෙන ඇත.	නිසි අනුමැතියක් ලබාගත යුතුය.

1.7 අනුකූල නොවීම්

1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

නීතිරීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 127 හා 128 වගන්ති හා සුසාන භූමි හා මිනී පිටි ආඥා පනතේ 3 වගන්තිය	සභා බලප්‍රදේශය තුළ පිහිටා ඇති සුසාන භූමි 05 ක සීමා නිර්ණයන් තීරණය කොට සභාවට පවරා ගෙන ගැසට් කිරීමට පියවර ගෙන නොතිබුණි.	මේ වන විට එම සුසාන භූමි 05 සඳහාම මිනින්දෝරු දෙපාර්තමේන්තුව මඟින් සීමා නිර්ණයන් ලබා ගැනීමට කටයුතු කර ඇති බව.	පවරා ගැනීම් කඩිනමින් සිදු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු. 85,936,778 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 73,425,256 ක් විය.

2.2 මූල්‍ය පාලනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 31 දිනට සභාවේ ජංගම ගිණුමක රු. 148,125,670 ක් පැවැති අතර. මෙම මුදල් කෙටිකාලීන තැන්පතුවක තාවකාලිකව හෝ ආයෝජනය කර පොළී ආදායමක් ලබාගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි.	2025 පෙබරවාරි 06 දින Money Market ගිණුමේ ආයෝජනය කර ඇති බව.	පිළිගත් ආයෝජනවල ආයෝජනය කළ යුතුය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කරන ලද සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

	2024				2023			
ආදායම් විෂයය	ඇස්තමේන්තුගත ආදායම	බිල්කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තුගත ආදායම	බිල්කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
	’000	’000	’000	’000	’000	’000	’000	’000
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
(i) වරිපනම් බදු	73,537	54,805	58,132	53,330	68,757	48,736	49,212	60,684
(ii) කුලී	52,006	13,232	18,307	33,355	11,889	11,530	12,243	34,948
(iii) බලපත්‍ර ගාස්තු	1,920	245	1,797	144	1,450	600	1,149	-
(iv) වෙනත් ආදායම්	134,096	-	141,011	-	8,511	3,567	3,567	-
එකතුව	**261,559**	**68,282**	**219,247**	**86,829**	**90,607**	**64,433**	**66,171**	**95,632**

2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟහිටි වරිපනම් හා බදු වටිනාකම රු. 53,329,966 ක් විය.	රජයේ දේපළ 15 ක් සඳහා හිඟ වරිපනම් මුදල රු. 2,873,065 ක් වන බව.	හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	සභාවේ කඩ කාමර 146 කින් 2024 දෙසැම්බර් 31 දිනට	2025 වර්ෂය තුළ මෙම හිඟ ශේෂයන් අයකර ගැනීමට කටයුතු	හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ

	රු. 16,435,900 ක් අයවිය යුතුව පැවැතිණි.	කරන බව.	යුතුය.
(ඇ)	ඉකුත් වර්ෂයට අදාළ හිඟ නිවාස කුලී රු. 14,492,098 ක් හා සමාලෝචිත වර්ෂයට අදාළ කුලී රු. 2,814,456 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකරගෙන නොතිබුණි.	හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කරන බව.	හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 පනතින් පවරා ඇති කාර්යන් ඉටු කිරීම.

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා, සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබූ කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත **දැක්වේ.**

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්ම අනුව වර්ෂය තුළදී නව අතුරු ව්‍යවස්ථා සහා සම්මත කර ගැනීම සඳහාද ක්‍රියාකාරකමක් ඇතුළත්ව තිබුණි. නමුත් 2024 වර්ෂය තුළදී සභාව විසින් කිසිදු අතුරු ව්‍යවස්ථාවක් සභා සම්මත කරගෙන නොතිබුණි.	අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් 21 ක් 2021 ඔක්තෝබර් 14 දින පැවති මාසික මහ සභාවේ යෝජනා සම්මත කර ඇති බව.	අදාළ සම්මත කර ගැනීම් සිදු කළ යුතුය.
(ආ)	පොදු මහජන පැමිණිලි, අනවසර ඉදිරිකිරීම් සහ අනතුරුදායක ගස් යන එක් එක් කාණ්ඩ යටතේ පැමිණිලි 307 ක් සභාව වෙත ලැබී තිබුණද එයින් පැමිණිලි 146 ක් ප්‍රවර්තන වර්ෂය අවසානය වන විටත් විසඳා නොතිබුණි.	තවදුරටත් 146 ක් විසඳීමට ඇති බව.	පැමිණිලි විසඳීමට කඩිනමින් කටයුතු කළ යුතුය.

3.2 අනාර්ථික ගණුදෙනු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂය තුළ රු. 1,985,313 ක් වැයකර නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩමක් වටා සභාව විසින් ඵලදායී නොවන ලෙස සංවර්ධන කටයුත්තක් සිදුකර තිබුණි**.**	වාහන ගාල් කිරීම සඳහා සභාව සතු වෙනත් ස්ථානයක් නොමැති බැවින්, මෙම ව්‍යාපෘතිය සිදුකරන ලද බව.	සංවර්ධන කටයුතු සිදු කිරීමට පෙර ඉඩමේ අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය.

3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.	යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇති බව.	වත්කම් ලේඛන යාවත්කාලීනව නඩත්තු කළ යුතුය.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
තාක්ෂණික නිලධාරීන්, ආදායම් පරීක්ෂක සහ වැඩ අධිකාරීන්ගේ ඉදිරි වැඩසටහන් අදාළ මාසයට පෙර මාසයේදී අනුමත කර නොතිබුණි. එමෙන්ම, පසු වැඩසටහන් පිළියෙල කිරීමේදී නිවාඩු දිනයන්හීත් රාජකාරි ඉටුකළ බව සඳහන් කර තිබුණි.	නියමිත දිනට පසු වැඩසටහන් ලබා ගැනීමේදී ඇඟිලි සලකුණු යන්ත්‍රයේ සටහන් නොවී ඇත්නම් නිවාඩු දිනයන් ලෙස සටහන් කිරීමට කටයුතු කරන බව.	ක්ෂේත්‍ර නිලධාරීන්ගේ රාජකාරී විධිමත්ව අධීක්ෂණය කළ යුතුය.

3.5 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
අංක 25/2014 සහ අංක 29/2019 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවලින් සහ 2024 ජූලි 01 දිනැති බඳවා ගැනීම් මත ඇති වූ අතිරික්ත සේවක සංඛ්‍යාව 106 ක් විය. මෙම පත්වීම් අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොකිරීම අතිරික්ත සේවක සංඛ්‍යාවක් ලෙස නිරීක්ෂණය විය.	අනුමත කාර්යය මණ්ඩලයට ඇතුළත් කර ගැනීම සඳහා මු.රෙ. 71 ප්‍රකාරව කටයුතු සිදුකරන බව.	අනුමත කරවා ගැනීම් සිදු කළ යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 වර්ෂය සඳහා සභාවේ ඉදිකිරීම්, කර්මාන්ත, පොදු පහසුකම් සහ ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.	2025 වර්ෂයේදී සිදුකිරීමට කටයුතු කරන බව.	සියලු අංශ ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණනය සිදුකළ යුතුය.

4.2 අයවැය පාලනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පුනරාවර්තන වැය විෂයයන් 30 කට අදාළ රු. 34,978,053 ක මුළු ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.	වියදම් ජනිත වී නොමැතිකමින් අදාළ ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව.	ප්‍රතිපාදන වෙන් කිරීම හා ඒවා උපයෝජනය විධිමත්ව කළ යුතුය.
(ආ)	ප්‍රවර්තන වර්ෂයේ සංවර්ධන කටයුතු වෙනුවෙන් ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු.99,090,400 ක් වුවද, ඉන් රු.15,370,318 ක් උපයෝජනය කර නොතිබුණි.	රු. 83,720,081 ක මුදලක් වියදම් කර තිබුණු බව.	අයවැය ලේඛනය පාලන කාරකයක් ලෙස යොදාගත යුතුය.

4.3 පාරිසරික ගැටළු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
බස්නාහිර පළාතේ 2008 අංක 01 දරන නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ රීතිවල 6 වන පරිච්ඡේදයේ 59 වැනි ඡේදය පරිදි සභාව විසින් කොම්පොස්ට් අංගනයක් පවත්වාගෙන ගොස් තිබුණද, එය බල ප්‍රදේශයේ සමස්ථ දිරන කසළවලින් කොම්පෝස්ට් සෑදීම සඳහා ප්‍රමාණවත් නොවීය. එහෙත් කොම්පෝස්ට් අංගනය පුළුල් කිරීම හෝ කසළ උපයෝගී කරගෙන ජීව වායු නිපදවීම වැනි වෙනත් විකල්ප ක්‍රම පිළිබඳව සභාව අවධානය යොමුකර නොතිබුණි.	ජීව වායු ඒකකයක් ස්ථාපනය නිෂ්ඵල ක්‍රියාවක් බව.	කසළ කළමනාකරණ කටයුතු විධිමත්ව කළ යුතුය.

4.4 තිරසර සංවර්ධන අරමුණු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
තිරසර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීමට අදාළව 2024 වර්ෂය දක්වා ක්‍රියාකාරකම් සැලසුම් කර තිබුණද, ඒවායේ ප්‍රගතිය පසුවිපරම් කර නොතිබුණි.	2025 වර්ෂයේ දී ප්‍රගති පරීක්ෂාව සිදු කරනු ලබන බව.	අරමුණු ලඟාකර ගැනීමේ ප්‍රගතිය සමාලෝචනය කළ යුතුය.